සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 34 S I

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I

කාලය පැය එකයි

සැලකිය යුතුයි :- ● සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**සැළකිය යුතුයි :**

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 දක්වා ඇති ප්‍රශ්නවලදී (1), (2), (3), (4) පිළිතුරු වලින් වඩාත් නිවැරදි හෝ ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. ග්‍රාහකයා අරමුණු කරගෙන සන්නිවේදකයා කරනු ලබ සිය හැඟීම් සිතිවිලි හෝ අදහස් ප්‍රකාශනය හඳුන්වනු ලබන්නේ,
    1. මාධ්‍ය. 2. සංදේශය. 3. සන්නිවේදනය. 4. බලපෑම.

02. ෂැනොන් විවර් ගණිතමය සූත්‍රය ගොඩනැංවීමට පදනම් කරගෙන ඇත්තේ,
    1. දුරකථන සන්නිවේදනය. 2. සමූහ සන්නිවේදනය.
    3. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය. 4. ජන සන්නිවේදනය.

03. ලැස්වේල් අර්ථකථනය,
    1. ද්විමාර්ගික සන්නිවේදන ක්‍රියාවලියකි. 2. චක්‍රීය සන්නිවේදන ක්‍රියාවලියකි.
    3. ඒකමාර්ගික සන්නිවේදන ක්‍රියාවලියකි. 4. බහුමාර්ගික සන්නිවේදන ක්‍රියාවලියකි.

04. සනක්නිවේදනයේ මූලික කාර්යයන් අතරට අයත් නොවන්නේ,
    1. තොරතුරු සැපයීම. 2. අධ්‍යාපනය ලබාදීම.
    3. විනෝදාස්වාදය 4. සංවාද සහ සාකච්ඡා

05. කෙනෙකුගේ පංචේන්ද්‍රිය මඟින් ලැබෙන විවිධ සංදේශ ග්‍රහණය කරගෙන එය තේරුම් ගැනීම හඳුන්වනු ලබන්නේ,
    1. අභිසාරිතාව 2. සංජානනය
    3. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය 4. පරිකල්පනය

06. දේශණයක් පැවැත්වෙන අතරතුරේ දී, විදුලි බලය ඇන හිටීම නිසා මහජන ඇමතුම් පද්ධතිය අක්‍රීය විය. ඉන්පසු කථිකයා කථා කළේ මයික්‍රොෆෝනය නොමැතිවය. පසු පෙළ සිටි අයට කථිකයාගේ හඬ නොඇසුණි. මෙහි දී ඇති වී ඇති සන්නිවේදන බාධකය වන්නේ,
    1. මාධ්‍ය බාධකයකි. 2. අර්ථ බාධකයකි 3. පාරිසරික බාධකයකි. 4. මාර්ග බාධකයකි.

07. උදෑසන පාසල් යන ඔබට අතරමඟ දී මිතුරෙකු හමුවෙයි. කථා කරයි. අදහස් හුවමාරු කරයි. මෙහි දී සිදු වී ඇති සන්නිවේදන වර්ගය වන්නේ,
    1. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය 2. ජන සන්නිවේදනය
    3. අන්තර් පුද්ගල සන්නිවේදනය 4. සමූහ සන්නිවේදනය

08. සන්නිවේදනය සඳහා පදනම වන්නේ,
    1. නිර්මාණශීලීත්වයයි. 2. භාෂාව 3. තාර්කික ඥානය 4. චින්තනය

09. භාෂාවේ මූලික කාර්යය වන්නේ,
    1. වාචික ප්‍රකාශන නොකිරීම. 2. සැබෑව හඳුනා නොගැනීම.
    3. සිතීම විධිමත් කිරීම 4. පැවැත්ම පිළිබඳ සාධක ඉදිරියට ගෙන නොයාම.

10. "ප්‍රදීපාගාර උපක්‍රමය" වඩාත් අදාළ වන්නේ,
    1. ජන සන්නිවේදනය 3. සමූහ සන්නිවේදනය
    2. ශ්‍රව්‍ය සන්නිවේදනය 4. පුද්ගලාන්තර සන්නිවේදනය

11. ඉගැන්වීමේ කාර්යය අතුරතුරේ දී පෙළ පොතේ පින්තූරයක් සිසුන්ට පෙන්වීම සඳහා වඩාත් උචිත ප්‍රක්ෂේපන යන්ත්‍රය
1. බහු මාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍රය. 2. ක්ෂණික ප්‍රක්ෂේපන යන්ත්‍රය.
3. ඕවර් හෙඩ් (Over head) ප්‍රක්ෂේපන යන්ත්‍රය. 4. ස්ලයිඩ් ප්‍රක්ෂේපන යන්ත්‍රය.

12. ලිඛිත සන්නිවේදනයේ දී භාෂාවේ රූපමය ස්වභාවය වන්නේ,
1. අක්ෂර භාවිතයෙන් සකස් කරන ලද ලේඛන. 2. නිර්මාණශීලීභාවය.
3. රූප සටහන් ඇඳීම. 4. ඡායාරූප එකතු කිරීම.

13. වාචික සහ ලිඛිත ලෙස භාෂාවේ රූප දෙකක් පැවතීම.
1. අභිසාරීතාවයයි. 2. සංජානනයයි. 3. භාෂා ද්විරූපීතාවයයි. 4. අක්ෂර වින්‍යාසයයි.

14. විවිධ පාර්ශව එක්ව පොදු අරමුණක් වෙනුවෙන් සංවිධානශීලී ලෙස කටයුතු කිරීමේ ලක්ෂණය ඇත්තේ,
1. අවිධිමත් සන්නිවේදනයෙහිය. 2. හරස් සන්නිවේදනයෙහිය.
3. වාචික සන්නිවේදනයෙහිය. 4. විධිමත් සන්නිවේදනයෙහිය.

15. එක් අයෙකුගෙන් තවත් අයෙකුට ද වශයෙන් දෙතුන් දෙනෙකුගෙන් පසු එම සංදේශය වැඩි දෙනෙකු අතර පැතිරියාමේ විධිමත් සන්නිවේදන ආකෘතිය හඳුන්වනු ලබන්නේ,
1. වයි ආකෘතිය. 2. චක්‍රීය ආකෘතිය. 3. දාම ආකෘතිය. 4. රෝද ආකෘතිය.

16. පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ පළමු පියවර වන්නේ,
1. අකුරු යෝජනය හා පිටු සැලසුම් කිරීම. 2. මුද්‍රණය හා පිටපත්කරණය.
3. අත් පිටපත සකස් කිරීම. 4. නිමි කටයුතු.

17. කාර්යාල ලිපි ලේඛන වල අත්සනක නිත්‍යානුකූල වලංගුබාවයක් ලැබෙන්නේ එහි තබන ලද,
1. දින මුද්‍රාව මඟිනි. 2. නිල මුද්‍රාව මඟිනි.
3. තැපැල් මුද්‍රාව මඟිනි. 4. ලිපි ශීර්ෂය ඇති කඩදාසිය මඟිනි.

18. ප්‍රක්ෂේපන කළ නොහැකි මාධ්‍ය උපකරණය වන්නේ,
1. ස්ලයිඩ් ප්‍රක්ෂේපන. 2. ඕවර් හෙඩ් ප්‍රක්ෂේපන යන්ත්‍රය.
3. ක්ෂණික ප්‍රක්ෂේපන යන්ත්‍රය. 4. කළුලෑල්ල.

19. යම් සංවිධානයක් තුළ නිශ්චිත පිළිවෙලට ක්‍රියාත්මක නොවන සන්නිවේදනය හඳුන්වන්නේ,
1. වාචික සන්නිවේදනය. 2. අවිධිමත් සන්නිවේදනය.
3. විධිමත් සන්නිවේදනය. 4. දෘශ්‍ය සන්නිවේදනය.

20. කාර්යාලයක කාර්යයන් සමාජයට විවෘත කිරීම සඳහා භාවිතා කළ හැකි ක්‍රමවේදයක් වන්නේ,
1. මුහුණුපොත හා සම්බන්ධවීම. 2. විද්‍යුත් තැපැල මඟින්.
3. වෙබ් අඩවියක් පවත්වාගෙන යාම. 4. විද්‍යුත් කැඳවනය හෙවත් පේජරය මඟිනි.

21. ඡායාරූප ශිල්පියෙකු සතු නොවිය යුතු ලක්ෂණයක් වන්නේ,
1. නිර්මාණශීලීබව.
2. අවසරයකින් තොරව වෙනත් අයෙකු ඡායාරූපයට ගැනීම.
3. නව තාක්ෂණය හා අත්වැල් බැඳ ගැනීම.
4. ආචාරශීලී පුද්ගලයෙකු වීම.

22. ශ්‍රී ලංකාවේ ප්‍රථම රූපවාහිනී සේවාව වූයේ,
1. ජාතික රූපවාහනී නාලිකාව. 2. දෙරණ රූපවාහනී නාලිකාව.
3. ස්වාධීන රූපවාහනී නාලිකාව. 4. සිරස රූපවාහනී නාලිකාව.

23. උත්තේජන හා ප්‍රතිචාර ස්වභාවය අනුව සිදුවන සන්නිවේදන වර්ගය නම්,
1. ජන සන්නිවේදනය. 2. පුද්ගලාන්තර සන්නිවේදනය
3. සමූහ සන්නිවේදනය. 4. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය

24. ශ්‍රී ලංකාවේ ප්‍රථම පුවත්පත වන්නේ,
1. ලක්මිණි පහන. 2. ලංකාලෝකය. 3. කලම්බු ජර්නල්. 4. දිනමිණ.

25. ශ්‍රී ලංකා රජයට හිමි ගුවන් විදුලි නාලිකාවක් වනුයේ,
1. සිරස FM. 3. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව.
2. දෙරණ ගුවන් විදුලි සේවය. 4. ලක්හඬ ගුවන් විදුලි සේවය.

26. ශ්‍රී ලංකාවේ පුවත්පත් ඉතිහාසය තුළ ආරම්භ කරන ලද ප්‍රථම පෞද්ගලික පුවත්පත් ව්‍යාපාරය ලෙස සැලකෙන්නේ,
1. ස්වාධීන පුවත්පත් සමාගම. 2. සීමාසහිත විජය පුවත්පත් සමාගම.
3. ලේක්හවුස් පුවත්පත් ආයතන. 4. වීරකේසරී පුවත්පත් සමාගම.

27. ආර්ථික නියෝජනය අධ්‍යයනයට අයත් වන ක්ෂේත්‍රයක් නම්,
1. සදාචාරය, සාරධර්ම හා සමාජ ප්‍රතිරූප.
2. වැඩලෝකය, විවිධ වෘත්තීන් හා වෙළඳපල.
3. ගැටුම්, සාමය හා සංවර්ධනාත්මක චින්තනය.
4. මානව ධර්ම හා විනෝදාත්මක බව.

28. රාජ්‍ය හිමිකම යටතේ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ආරම්භ කරන ලද්දේ,
1. 1979. 2. 1991. 3. 1982. 4. 1980.

29. කැමරාවක් බිහිවීමට අවශ්‍ය මූලික පදනම ගොඩනැගෙන්නේ,
1. සේයා පටල කැමරාව. 2. කැමරා ඔබ්ස්කියුරාව.
3. ඩිජිටල් කැමරාව. 4. ඒක කාච කැමරාව.

30. ඡායාරූපයක් ගැනීමේ පියවරයන්ට අයත් නොවන්නේ,
1. මානනය. 2. නාභිගත කිරීම. 3. අනාවරණය. 4. කාච විවරය.

31. 1897 දී ප්‍රථම ගුවන් විදුලි සංඥා සමාගම ආරම්භ කළ රට වනුයේ,
1. එංගලන්තය. 2. ඉතාලිය. 3. ශ්‍රී ලංකාව. 4. ඇමෙරිකාව.

32. 'දිනමිණ' පුවත්පත ආරම්භ කළ කර්තෘවරයා වන්නේ,
1. G.D. පැලිස් අප්පුහාමි. 2. H.S. පෙරේරා. 3. E. ඩාර්ලි. 4. D.R. විජයවර්ධන.

33. ස්පර්ශ කිරීමෙන් පරිගණක වැඩසටහන ක්‍රියාත්මක කළ හැකි උපකරණය වන්නේ,
1. ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපන යන්ත්‍රය. 2. ක්ෂණික ප්‍රක්ෂේපන යන්ත්‍රය.
3. අන්තර් ක්‍රියාකාරී පුවරුව. 4. කදා ප්‍රක්ෂේපන යන්ත්‍රය.

34. අන්තර් පුද්ගල සන්නිවේදනය සඳහා යොදා ගැනෙන සන්නිවේදන මෙවලමක් නොවන්නේ,
1. දුරකථනය. 2. ෆැක්ස් යන්ත්‍රය. 3. විද්‍යුත් තැපැල. 4. පුවත්පත.

35. මහාචාර්ය හැරල්ඩ් ඩී. ලැස්වේල් මහතා
1. ගණිතය පිළිබඳ මහාචාර්යවරයෙකි.
2. දේශපාලන විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙකි.
3. ජන සන්නිවේදනය පිළිබඳ මහාචාර්යවරයෙකි
4. තාක්ෂණ විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙකි.

36. රූපාක්ෂර මඟින් අදහසක් ඉදිරිපත් කර නැති අක්ෂර අතරට අයත් වන්නේ,
1. චීන. 2. කොරියානු. 3. ජපන්. 4. ශ්‍රී ලාංකික.

37. ආදි මානවයා ගුහා චිත්‍ර මඟින් අදහස් ප්‍රකාශ කිරීමෙන් පෙනී යන්නේ,
1. නිර්මාණාත්මක සන්නිවේදනය. 2. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය.
3. ජන සන්නිවේදනය. 4. සමූහ සන්නිවේදනය.

38. මුද්‍රණ ශිල්පය ආරම්භ කර ඇත්තේ,
1. ඉතාලි ජාතිකයින්. 2. චීන ජාතිකයින්. 3. ජර්මන් ජාතිකයන්. 4. ජපන් ජාතිකයින්.

39. ප්‍රාථමික සන්නිවේදන ක්‍රමයක් නොවන්නේ,
1. හූව. 2. ගිනිමැලය. 3. කොළ අතු එල්ලීම. 4. කඩදාසිය මත ලිවීම.

40. සන්නිවේදනයේ මූලිකාංග අතරට අයත් නොවන්නේ,
1. මාධ්‍ය. 2. සන්නිවේදකයා. 3. ග්‍රාහකයා. 4. බාධක.

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

**10 ශ්‍රේණිය** | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | **34 S II**

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II** | **කාලය පැය දෙකයි**

සැලකිය යුතුයි :- ● සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**සැලකිය යුතුයි:**

● **පළමුවන ප්‍රශ්නය හා තෝරා ගන්නා තවත් ප්‍රශ්න 04 ක් ඇතුළුව ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

● **පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමිවේ.**

(01) එක්තරා පාසලක මාධ්‍ය දිනයට සමගාමීව පවත්වන ලද මාධ්‍ය තරගාවලියේ සමාරම්භක උළෙල, විවිධ පාසල්වල මාධ්‍ය සමාජ සාමාජිකයින් හා විවිධ මාධ්‍ය ආයතන වල මාධ්‍යවේදීන්ගේ ද සහභාගීත්වයෙන් ඉතා සාර්ථක ලෙස පවත්වන ලදි. මාධ්‍යවේදීන්ගේ ප්‍රධානත්වයෙන් ඉතා දක්ෂ විනිසුරු මඩුල්ලකගෙන් සමන්විත වූ මාධ්‍ය තරගාවලිය ද එදින දවස පුරාම පැවැත්වීය.

i. මෙම අවස්ථාව තුළ දැකිය හැකි සන්නිවේදන වර්ග දෙකක් ලියන්න.
ii. මෙහිදී එක් එක් මාධ්‍ය සමාජ වෙන් වෙන් ව හඳුනාගැනීම සඳහා උපකාරී වන අවාචික සන්නිවේදන අංග 2 ක් ලියන්න.
iii. මෙම අවස්ථාව විධිමත් සන්නිවේදන අවස්ථාවක් යයි සැලකීමට හේතු වූ කරුණු 2 ක් ලියන්න.
iv. මෙම අවස්ථාවේ දී තරඟකරුවන් හට පොදු උපදෙස් ලබාදීමට පාවිච්චි කරන්නට ඇතැයි සිතිය හැකි ප්‍රක්ෂේපන යන්ත්‍රයක් නම් කරන්න.
v. මෙම තරගාවලිය පිළිබඳව වෙනත් පාසල් වල මාධ්‍ය සමාජ දැනුවත් කිරීම සඳහා යොදා ගත හැකි මුද්‍රිත මාධ්‍ය ස්වරූප 2 ක් ලියන්න.
vi. මෙම සමාරම්භක උළෙලෙහි එක් එක් අවස්ථා ඡායාරූප ගත කිරිම සඳහා භාවිතා කළ හැකි කැමරා වර්ග 2 ක් නම් කරන්න.
vii. මෙම අවස්ථාවේ දී බලාපොරොත්තු විය හැකි සන්නිවේදන අරමුණු 2 ක් ලියන්න.
viii. මෙම තරඟාවලිය පිළිබඳව සමාජය දැනුවත් කළ හැකි නූතන සමාජ මාධ්‍ය ජාලයක් නම් කරන්න.
ix. මෙම තරඟාවලියේ ජයග්‍රාහක, ජයග්‍රාහිකාවන්ගේ නාම ලේඛනය ඇතුළත් පොතක් සකස් කිරීමට, මාධ්‍ය දිනය සැලසුම් කරන සංවිධායක මණ්ඩලය තීරණය කරන ලදි. ඒ සඳහා භාවිතා කරන පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ මුල් පියවර 2 සඳහන් කරන්න.
x. පිටු සැලසුම් කිරීම ද මෙහි දී අපේක්ෂා කරන බැවින් ඒ සඳහා යෝග්‍ය මෘදුකාංගයක් ලියන්න.

(ල. 2 x 10 = 20)

(02) ලේඛනයක් යනු භාෂාවේ දෘශ්‍ය ස්වරූපයයි.

i. සන්නිවේදනය සඳහා යොදා ගනු ලබන ප්‍රධාන සන්නිවේදන උපකරණය කුමක් ද? (ල. 01)
ii. 'භාෂා ද්විරූපීතාව' යනු කුමක් ද? (ල. 02)
iii. 'වාචික භාෂාවට වඩා ලිඛිත භාෂාව විධිමත්ය' මෙය සනාථ කිරීම සඳහා කරුණු 03 කින් පැහැදිලි කිරීමක් කරන්න. (ල. 03)
iv. ඵලදායී ලේඛනයක ඇති ලක්ෂණ පිළිබඳ විස්තර කරන්න. (ල. 04)

(03) නූතන සමාජය තොරතුරු සමාජයක් ලෙස සැලකිය හැක.

i. තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා කාර්යාල වල යොදා ගන්නා උපකරණ 02 ක් ලියන්න.(ල. 01)
ii. ප්‍රධාන වශයෙන් දුරකථන වර්ග දෙකක් මේ වන විට භාවිත වේ. ඒවා මොනවාද? (ල. 02)
iii. දුරකථනයෙන් කථනයට සම්බන්ධ දෙපාර්ශ්වය විසින් පිළිපැදිය යුතු ආචාර ධර්ම 03 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 03)
iv. ජංගම දුරකථනයකින් ලබාගත හැකි පහසුකම් පිළිබඳව විස්තරයක් කරන්න. (ල. 04)

(04) ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියෙහි ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා පන්ති කාමරයේ දී මාධ්‍ය උපකරණ වල අවශ්‍යතාවය ඉතා වැදගත් වේ.

i. පන්ති කාමරයේ දී භාවිතා වන ප්‍රක්ෂේපන නොවන මාධ්‍ය උපකරණ 02ක් නම් කරන්න. (ල. 01)

ii. ගුරුවරයා විසින් සිතියමක් ඇඳ විශාලනය කර සිසුන් හට පෙන්වීම සඳහා භාවිතා කළ හැකි ප්‍රක්ෂේපන උපකරණයක් නම් කරන්න. (ල. 02)

iii. පන්ති කාමරයක් සඳහා ඉතා සජීවී හා ආකර්ශණීය මෙන්ම, ඉතා ඵලදායී උපකරණයක් වන බහු මාධ්‍ය ප්‍රක්ෂේපන උපකරණය පිළිබඳව කෙටි පැහැදිලි කිරීමක් කරන්න. (ල. 03)

iv. පන්ති කාමරයෙහි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට තාක්ෂණික මාධ්‍ය උපකරණ භාවිතයෙන් සිසුනට ලැබෙන වාසි 4 ක් නම් කර, ඉන් එක වාසියක් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 04)

(05) ජන මාධ්‍ය සංදේශ අර්ථකථනය කරගැනීම සඳහා ඒ ඒ ජන මාධ්‍යයේ හිමිකම පිළිබඳව ඇති අවබෝධය වැදගත් වේ.

i. පෞද්ගලිකව තමන් විසින් ම සංස්කරණය කරමින් තමන්ගේ අයිතිය යටතේ ප්‍රකාශනයට පත්කරන ලද කර්තෘ හිමි පුවත්පත් 02 ක් නම් කරන්න. (ල. 01)

ii. ගුවන් විදුලි සේවා හිමිකම වර්ගීකරණය කරන්න. (ල. 02)

iii. පුවත්පතක ප්‍රධාන කර්තෘගේ කාර්යභාරය පිළිබඳව කෙටි පැහැදිලි කිරීමක් කරන්න. (ල. 03)

iv. දරුවන් තුළ පුරවැසිභාවය පිළිබඳ සංකල්පය පෝෂණය කිරීම ජනමාධ්‍ය තුළින් ද සිදුවිය යුතුය. යහපත් පුරවැසියෙකු සතු ලක්ෂණ 02 ක් නම් කර ඉන් එකක් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 04)

(06) පාසලක කාර්යක්ෂමතාවය නඟා සිටුවීම සඳහා නූතන මාධ්‍ය තාක්ෂණය මනා රුකුලක් වී තිබේ.

i. පාසලක අභ්‍යන්තර සන්නිවේදන කටයුතු සඳහා යොදා ගෙන ඇති සන්නිවේදන පද්ධතිය හඳුන්වන්න. (ල. 01)

ii. පාසලේ ආරක්ෂාව සඳහා යොදා ගත හැකි කැමරා පද්ධතිය නම් කරන්න. (ල. 02)

iii. 12 ශ්‍රේණියේ සිසුන්ගේ ව්‍යාපෘතියට අදාළ ඡායාරූප අංකිත කැමරාවක් මඟින් ලබා ගන්නා ලදී. අංකිත කැමරාවේ විශේෂතා 03 ක් ලියන්න. (ල. 03)

iv. කාර්යාලයීය වශයෙන් පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලිය භාවිතා කිරීමෙන් ඇති වන වාසි 02 ක් නම් කර,ඉන් එක් වාසියක් පිළිබඳව විස්තර කරන්න. (ල. 04)

(07) ඔබේ පාසලේ 10 ශ්‍රේණියේ ශිෂ්‍ය රැස්වීමක දි සන්නිවේදනයේ වැදගත්කම පිළිබඳව කථාවක් කිරීමට ඔබට පැවරී ඇතැයි සිතන්න.

i. මෙහි දි ඇති සන්නිවේදන වර්ගය කුමක් ද? (ල. 01)

ii. ඔබ භාවිතා කරන අවාචික සන්නිවේදන ක්‍රම 02 ක් ලියන්න. (ල. 02)

iii. ඉහත I උත්තරයේ සඳහන් කළ සන්නිවේදන වර්ගයේ ඇති විශේෂතා 03 ක් පැහැදිලි කරන්න.(ල. 03)

iv. වාචික සන්නිවේදනයේ සාර්ථකත්වය සඳහා භාෂා කුසලතා සංවර්ධනය කිරීමෙහි ලා අවධානය යොමු කළ යුතු අංග මොනවාදැයි පැහැදිලි කරන්න. (ල. 04)

# තෙවන වාර පරීක්ෂණය - 2019
## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

10 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | |
|---|---|---|---|
| 01 - 2 | 11 - 2 | 21 - 2 | 31 - 1 |
| 02 - 1 | 12 - 1 | 22 - 3 | 32 - 2 |
| 03 - 3 | 13 - 3 | 23 - 4 | 33 - 3 |
| 04 - 4 | 14 - 4 | 24 - 2 | 34 - 4 |
| 05 - 2 | 15 - 1 | 25 - 3 | 35 - 2 |
| 06 - 1 | 16 - 3 | 26 - 3 | 36 - 4 |
| 07 - 3 | 17 - 2 | 27 - 2 | 37 - 1 |
| 08 - 2 | 18 - 4 | 28 - 3 | 38 - 2 |
| 09 - 3 | 19 - 2 | 29 - 2 | 39 - 4 |
| 10 - 3 | 20 - 3 | 30 - 4 | 40 - 3 |

(1x40 = 40)

### II කොටස

(01) i. සමූහ සන්නිවේදනය, අන්තර් පුද්ගල සන්නිවේදනය, අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය,

ii. ඇඳුම්, නිල ලාංඡන, කොණ්ඩා විලාසිතා, අංක .......

iii. - න්‍යාය පත්‍රයක් අනුව උත්සවය පැවැත්වීම.
- සංවිධානාත්මක බව
- නියමිත වේලාවට උත්සවය හා තරග පැවැත්වීම.

iv. බහු මාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍රය

v. අත්පත්‍රිකා, පෝස්ටර්ථ දැන්වීම්, ලිපි, E-mail, fax, SMS ... යනාදිය

vi. සේයා පටල කැමරා, ඩිජිටල් කැමරා

vii. අධ්‍යාපනය ලබාදීම, විනෝදාස්වාදය, තොරතුරු ලබාදීම, පෙළඹවීම

viii. Twitter, Face book, linked in

ix. - අත් පිටපත සැකසීම
- අකුරු යෝජනය හා පිටු සැලසුම් කිරීම.
- මුද්‍රණ හා පිටපත්කරණය
- නිමි කටයුතු

x. - ඇඩොබි පේජ් මේකර්
- ඇඩොබි ඉන්ඩිසයින්
- මයික්‍රොසොෆ්ට් පබ්ලිසර්
- කොරල් ඩ්‍රෝ

(02) i. භාෂාව

ii. වාචික සහ ලිඛිත ලෙස භාෂාව පැවතීම.

iii. - ව්‍යාකරණ තිබීම, අක්ෂර වින්‍යාසය, අකුරුවලට හැඩයක් තිබීම
- විරාම ලක්ෂණ යෙදීම, ලිවීමේ දී වචන ඈත් කර ලිවීම
- එක් වාක්‍යයක් තවත් වාක්‍යකින් වෙන් කර දැක්වීම.
- එක් ජේදයක් තවත් ජේදයකින් වෙන් කර දැක්වීම.

iv. - නිරවුල් හා පැහැදිලි බව
- ලේඛනයට උචිත ආකෘතිය හා නිර්මාණශීලී බව
- සම්මත ව්‍යාකරණ විධි භාවිතය

(03)i. දුරකථනය, ෆැක්ස් යන්ත්‍රය, පේජරය, විද්‍යුත් තැපෑල ... යන ඒවායින් 2 ක්
ii. - ස්ථාවර දුරකථන
- ජංගම දුරකථන
iii. - ඇමතුමේ ආරම්භකයා තම අනන්‍යතාවය හෙළි කළ යුතුය.
- දෙපාර්ශවයේ ගෞරවය රැකෙන පරිදි වචන භාවිතා කළ යුතුය.
- පණිවුඩය ලබන්නාට පැහැදිලිව තේරුම් ගත හැකි ආකාරයෙන් ඉදිරිපත් කරන්න.
- ...............
- ............
( 10 ශ්‍රේණියේ පෙළ පොතේ 77 පිටුව)
iv. - දුරකථනක ඇමතුම් ලබාදීම හා ගැනීම.
- කෙටි පණිවුඩ ලබාදීම හා ගැනීම.
- කැමරාවක් ලෙස භාවිතා කිරීම.
- කැල්කියුලේටරයක් ලෙස භාවිතා කිරීම.
- ෆේස් බුක් එකට යාම
- ................
- .............. ( සිසුන් ලියා ඇති ගැළපෙන පිළිතුරකට ලකුණු ලබා දෙන්න.)

(04) i. කළු ලෑල්ල, සුදු ලෑල්ල, කාන්දම් ලෑල්ල, පත්‍රිකා ලෑල්ල, පිටු පෙරළනය
ii. ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපන යන්ත්‍රය (OHP) එක
iii. පරිගණකයේ තිරයේ දිස්වන අපට අවශ්‍ය ලේඛන, හඬ, චලන රූප, වීඩියෝ, සිනමා ආදී කුමක් වුවත්
- විශාල තිරයකට ප්‍රක්ෂේපනය කිරීමට මෙම යන්ත්‍රය අවශ්‍ය බව.
- ඉදිරියෙන් තිරයක් තිබිය යුතු බව.
- ශබ්ද විකාශන පහසුකම් අවශ්‍ය බව .
- ....................... වැනි අදාල කරුණු ඇතුළත් විය යුතුය)
iv. - ඉගෙනුම් තාත්වික බව
- කාර්යයෙහි ඵලදායීත්වය ඉහළ නැංවීම
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් උද්යෝගිමත් හා ආකර්ශණීය බවට පත්කිරීම.
- තොරතුරු ග්‍රහණය කර ගැනීමට, තේරුම් ගැනීමට, මතකයේ රඳවා ගැනීමට හැකිවීම, පරිසරය ප්‍රියජනක බවට පත්වීම.
- කාල කළමනාකරණය මැනවින් සිදුවීම.

(05) i. කවට කථිකයා, උදය කාරකෙ, ඔබ්සවර් හා කොමර්ෂල් ඇඩ්වර්ටයිසර්
ii. - රාජ්‍ය හිමිකම සහිත ගුවන් විදුලි සේවාව
- මහජන සංවිධාන හිමිකම සහිත ගුවන් විදුලි සේවාව
- පෞද්ගලික ව්‍යාපාර හිමිකම සහිත ගුවන් විදුලි සේවාව
iii. - පුවත්පතක ප්‍රධාන මාධ්‍යවේදියා බව
- පුවත්පතේ අන්තර්ගතය හා ව්‍යුහය පිළිබඳව සමස්ත වගකීම දරන්නේ මොහු බව
- පුවත්පතක සංස්කාර වැකිය හෙවත් කතු වැකිය ලිවීමේ වගකීම දරන බව
iv. - ප්‍රජාතාන්ත්‍රිකව ජීවත්වීම.
- සමාජ සුභසාධනයට දායක වීම.
- දේශාභිමානීව කටයුතු කිරීම.
- සියලු ආගම්/ ජාතීන්ට ගරු කිරීම/ වෘත්තිකයක නියැලීම.
- ආචාරශීලී වීම/ ගුණගරුක වීම, ජීවත්වීම

(06) i. අභ්‍යන්තර ඇමතුම් පද්ධතිය
ii. CCTV කැමරා පද්ධතිය (සංවෘත පරිපථ රූපවාහිනී කැමරා පද්ධතිය)
iii. - ඉහළ ආලෝක සංවේදිතාවක් දක්වන නිසා අඩු ආලෝක තත්ත්වයක් යටතේ වුවත්, ඡායාරූප ගැනීමට හැකිවීම.
- ලබාගත් ඡායාරූප ඒ අවස්ථාවේ දීම නැරඹිය හැකිවීම.
- ඉහළ කාර්යක්ෂතාවය
- ------------------ (10 ශ්‍රේණිය පෙළපොතේ 149 පිටුව)
iv. අඩු පිරිවැය, ආකර්ශණීය නිමාව, ඉක්මන් බව , පහසුව, කාර්යක්ෂමතාව

(07) i. සමූහ සන්නිවේදනය
ii. කාය භාෂාව, සමාජීය සාධක, පාරිසරික සාධක, සංඥා, සංකේත
iii. - සන්නිවේදකයා එක් අයෙක් වන අතර, ග්‍රාහකයන් සමූහයක් වන නිසා ඔවුන් විවිධ වන්නට පුළුවන.
- සන්නිවේදකයා හා ග්‍රාහකයන් අතර සම්බන්ධතාව යම් ප්‍රමාණයක දුරස්ථභාවයක් ගනී.
- -----------------------
- ----------------------- ( 10 ශ්‍රේණියේ පෙළපොත - 31 පිටුව)
iv. උච්චාරණය, අර්ථ ගැන්වීම, යෝග්‍යතාවය.